**සමූපකාර සංවර්ධන අරමුදල - 2017**

**------------------------------------------------**

සමූපකාර සංවර්ධන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමූපකාර සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

----------------------------------------------

(i) ප්‍රමිතයේ 21 ඡේදය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමග ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණු අතර දායක මුදල්, චක්‍රීය අරමුදල, මහජන බැංකු ආධාර හා පොදු තැන්පත් ගිණුම යනාදිය සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 59 ඡේදය ප්‍රකාරව රු.6,132,446 ක් වූ අඩමාන ණය, ආදායම් වියදම් ප්‍රකාශනයේ මුහුණතෙහි දැක්වීමකින් තොරව වෙනත් වියදම් යටතේ ඇතුළත් කර තිබුණි.

(iii) ප්‍රමිතයේ 70 ඡේදය ප්‍රකාරව ශේෂපත්‍රයේ ජංගම වත්කම් ද්‍රවශීලතා අනුපිළිවෙලට පෙළගස්වා නොතිබුණි.

(iv) ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ දේපළ, පිරියත හා උපකරණවල ධාරණ අගය, ක්ෂය අනුපාත, ආයෝජන හා ආයෝජන පොලී යනාදිය සම්බන්ධව මිනුම්කරණ පදනම් හෙළිදරව් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

-------------------------------------------------

(i) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහයට බලපෑමක් නොවූ සමුච්චිත අතිරික්තයේ රු.298,261 කින් වූ වෙනස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 40 ඡේදය ප්‍රකාරව රු.11,205,187 ක් වූ ආයෝජන පොළී ලැබීම් ආයෝජන මුදල් ප්‍රවාහයක් ලෙස වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී මුදලින් කළ ස්ථාවර තැන්පතු ආයෝජනය රු.64,500,000 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ස්ථාවර තැන්පතු අත්පත් කර ගැනීමේ මුදල් ගලායාම රු.96,083,650 ක් ලෙස දක්වා තිබුණි.

### (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.4,755,627ක් වූ ජංගම නොවන වත්කම් අයිතම් 08 ක් සම්පුර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අරමුදල වෙත ලැබුණු රු.16,200,000 ක් වූ රාජ්‍ය බැංකු ආධාර එම වර්ෂයන්වල ආදායමක් ලෙස හඳුනා නොගෙන ගෙවිය යුතු ශේෂයක් ලෙස සටහන් කර තිබුණු අතර එම ආධාර ආදායම් ලෙස හඳුනාගන්නා ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) රාජ්‍ය බැංකු ආධාරවලින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබුණු රු.3,272,725 ක් වූ පරිගණක උපාංග උපකරණ, පරිගණක වත්කම් ගිණුමේ සටහන් කර නොතිබුණි. මේ හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රාජ්‍ය බැංකු ආධාරවලින් රු.306,657 ක් වූ පුහුණු වියදමක් දරා තිබුණද එය ආදායම් වියදම් ගිණුමට සටහන් කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු දායක මුදල් උපලේඛනයේ එකතුව මූල්‍ය ප්‍රකාශනයේ වටිනාකමට වඩා රු.915,797 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| (අ) කෘෂි අරමුදල් අතිරික්තය | 14,503,854 | ශේෂ සනාථ කිරීම |
| (ආ) සමුපකාර සමිති ණය | 47,164,884 | |
| (ඇ) නොපියවූ අත්තිකාරම් | 45,525 | |
| (ඇ) වෙනත් ජංගම වත්කම් | 20,000 | |
| (ඉ) ණය ලබාදීම ඌව පලාත | 5,439,905 | |

**2.3 ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු 1997 වර්ෂයේ සිට පැවත එන රු.2,666,000 ක් වූ සමුපකාර විදුහල් ණය, 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.1,999,600 ක් වූ කාර්යසාධන අත්තිකාරම් සහ රු.1,184,000 ක් වූ උසාවි වන්දි අයකර ගෙන නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 188 (2) | 2011 හා 2012 වර්ෂයන්ට අදාළ එකතුව රු.300,000 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් 2018 ජූලි 15 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) 4.2 ඡේදය | අරමුදලේ බැංකු ගිණුම සහ පොත්පත්, නිතිපතා සසඳා ප්‍රගතිය පිළිබඳ එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 4.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.27,420,879 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,701,425 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,719,454 ක වර්ධනයක් විය. දායක මුදල් ආදායම රු.22,839,915 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2014 වර්ෂයේදී ඌනතාවයක් පැවති අතර 2013, 2015, 2016 හා 2017 වර්ෂයන්හිදී මූල්‍ය අතිරික්තයක් පැවතුණි. එසේම, සේවක පාරිශ්‍රමික හා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු 2013 වර්ෂයේ රු.5,861,199 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.20,535,476 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

#### 4.1.1 සැලසුම් කිරීම

-----------------

1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් නිවේදනය මගින් පළ කරන ලද සමුපකාර රීතීන්හි 43 වගන්තිය ප්‍රකාර සමුපකාර අරමුදලෙහි මුදල් යෙදවිය හැකි කාර්යයන් ලෙස සමුපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ, සමුපකාර සමිතිවල කලමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම හා සමුපකාර සමිතිවලට උපකාර කිරීම සඳහා යෙදවිය හැකි බව දක්වා තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව අරමුදල මගින් සමුපකාර සමිති වෙත රු.මිලියන 20 ක් ණය/ප්‍රදාන ලබාදීම දක්වා තිබුණද 2012 වර්ෂයෙන් පසු කිසිදු මුදලක් ණය/ප්‍රදාන වශයෙන් ලබා දී නොතිබුණි.

(ආ) ඉහත කාර්යයන් සඳහා වියදම් කිරීමකින් තොරව රු.4,985,681 ක් සමුපකාර දින උත්සවය සඳහාද, රු.4,518,656 ක් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ විදේශ පුහුණු වියදම් සඳහාද, වැය කර තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

සමාලෝචිත වර්ෂයේ බැංකු ජංගම ගිණුමේ වාර්ෂික සාමාන්‍ය ශේෂය රු.9,178,067 ක් වූ අතර මාසික සාමාන්‍ය වියදම් පුරෝකථනය කර අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමුපකාර සමිතියට 2012 වර්ෂයේදී ලබා දුන් රු.3,000,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.2,983,090 ක ණය ශේෂයක් හා හිඟ හිටි රු.1,173,332 ක පොලිය අයකර ගෙන නොතිබුණි. ණය ගිවිසුම් ප්‍රකාරව මාසික ණය වාරිකය රු.55,556 බැගින් වාරික 54 කින් ණය අයකරගත යුතුවද ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) සමුපකාර සමිති 59 කින් අයවිය යුතු රු.34,303,931 ක් වූ ණය ශේෂය වර්ෂ 15 ත් වර්ෂ 53 ත් අතර කාල පරාසයක සිට අය නොවී පැවති අතර එම අක්‍රීය ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී අය වී තිබුණේ එක් සමිතියකින් රු.35,449 ක් පමණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට රු.63,418,814 ක් වූ ලැබිය යුතු දායක මුදල් ශේෂයෙන් රු.36,499,383 ක් එනම් සියයට 57.6 ක ඉහළ ප්‍රතිශතයක් සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සමිතියෙන් අයවිය යුතුව පැවතුනි. දායක මුදල් ලෙජරය අනුව එම ශේෂය 2006 වර්ෂයට පෙර වර්ෂවල කරන ලද විගණනයන්ට අදාළව වෙන් කරන ලද දායක මුදලින් ලැබිය යුතු බව නිරීක්ෂණය විය. 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ

44(1) වගන්තිය ප්‍රකාරව සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් සමුපකාර සමිති විගණනය කළ යුතු වුවත් මෙම සමිතියට අදාළව අවසන් වරට විගණනයන් සිදු කර තිබුණේ 2012 වර්ෂයේදීය.

(ඈ) සමුපකාර සමිති 21 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු දායක මුදලක් ලැබී නොතිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට එම සමිතිවලින් රු.12,151,415 ක දායක මුදල් ලැබිය යුතුව පැවතුනි.

(ඉ) අරමුදලේ අරමුණුවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී විදේශ වැඩ මුළු 10 ක් සඳහා නිලධාරින් 19 දෙනෙකු වෙනුවෙන් රු.4,518,656 ක් වැය කර තිබුණි. එකී වැඩමුළුවලට සහභාගි වීමෙන් තමන් ලබා ගත් දැනුම සහ අත්දැකීම්, තම රාජකාරි කටයුතුවලදී භාවිතා කරනු ලබන ආකාරය පිළිබඳ වාර්තා ඉදිරිපත් කර තිබුණේ නිලධාරින් 11 දෙනෙකු පමණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

යුධ හානිවලට ලක් වූ සමුපකාර සමිති යලි ගොඩනැංවීම සඳහා 2015 වර්ෂයේදී කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු රු.29,000,000 ක මුදලින් මන්නාරම දිස්ත්‍රික් ලේකම් වෙත ව්‍යාපෘති 04 ක් සඳහා රු.28,000,000 ක් සහ උතුරු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ව්‍යාපෘතියක් සඳහා රු.1,000,000 ක් දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේදී යවා තිබුණි. එම ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දෙපාර්තමේන්තුව පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. මන්නාරම දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2016 වර්ෂයේදී රු.2,000,000 ක් ද සමාලෝචිත වර්ෂයේදී රු.16,000,000 ක් ද වශයෙන් මන්නාරම දිස්ත්‍රික් ලේකම් විසින් දෙපාර්තමේන්තුව වෙත ආපසු එවන ලද රු.18,000,000 ක මුදල අමාත්‍යාංශයට ප්‍රේෂණය කිරීමකින් තොරව අරමුදලේ බැරකමක් ලෙස 2018 අගෝස්තු 31 දින වන විටත් රඳවා ගෙන තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | උපයෝගී පොත් යාවත්කාලීන කිරීමේ ප්‍රමාදය හා ජ'නල් වවුචර් පිළියෙල නොකිරීම. |
| (ආ) | මූල්‍ය පාලනය | සමුපකාර සමිතිවලින් ණය අයකර ගැනීමේ ප්‍රමාදය හා පසුවිපරම් කටයුතු නිසි පරිදි සිදු නොකිරීම. |
| (ඇ) | දායක මුදල් අයකර ගැනීම | සමිති විගණනය හා සමුපකාර සමිතිවලින් දායක මුදල් අයකිරීම ප්‍රමාද වීම |